**වැලිගම ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය.**
**--------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි මස 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී විවිධ ප්‍රතිපාදන යටතේ ඉදිකළ රු.2,973,826 ක් වටිනා ගොඩනැඟිලි, ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | මෙම වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භකර නොතිබූ කර්මාන්ත දෙකක් වෙනුවෙන් රු.2,201,681 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ණයහිමි ප්‍රතිපාදන ගිණුම්ගත කළ යුතුවේ. | කර්මාන්ත විෂය ලබාදෙන තොරතුරු පදනම්ව අවසන් ගිණුම සකස් කර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.310,864 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | බිල්පත් පරීක්ෂාවට ඉදිරිපත් කිරීමේදී සිදුවන සංශෝධනයන් හා ඉටුකර ඇති අමතර වැඩ වටිනාකම් සඳහාද වටිනාකම් සංශෝධනයන් සිදුවේ. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට කාර්මික භාණ්ඩ තොගය රු.84,598 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | තොග නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ද්විගණන දෝෂයක් සිදුවී ඇත. |
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.193,650 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව උසාවි දඩ ගිණුම්ගත කළ යුතුවේ. | එම වටිනාකම් ඇස්තමේන්තු අගයක් ලෙසට දක්වනු ලබන අතර පසුවට උපලේඛන ලැබීමෙන් අනතුරුව එම සත්‍ය අගයන් මත ඌණ හෝ අධි වෙන්කිරීමක් ලෙසට ගැලපීම් කරමි. |

**1.4 අනුකූල නොවීම**

------------------

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 . | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය තුළ ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදු කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක පපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛයේ 05 වන වගන්තිය. | ප්‍රාදේශීය සභාව සතු වෙළඳ සංකීර්ණ හතරකට අයත් කඩකාමර හයක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නැවත සිහි කැඳවීම් ලිපි යැවීම සඳහා කටයුතු කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 61,505,655 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.63,645,269 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,955,200 | 3,610,693 | 3,424,594 | 1,539,912 | 4,590,500 | 5,496,311 | 5,311,532 | 1,353,812 |
| කුලී | 3,735,600 | 3,245,491 | 2,654,143 | 1,352,900 | 3,657,500 | 3,066,989 | 2,893,534 | 761,552 |
| බලපත්‍ර ගාස්තු | 5,667,500 | 11,112,302 | 10,809,302 | 1,803,000 | 4,175,500 | 7,809,196 | 6,363,346 | 1,500,000 |
| වෙනත් ආදායම් | 60,655,000 | 78,512,849 | 33,411,971 | 184,136,728 | 54,370,600 | 61,101,942 | 7,969,035 | 139,035,850 |
| **එකතුව** | 74,013,300 | 96,481,335 | 50,300,010 | 188,832,540 | 66,794,100 | 77,474,438 | 22,537,447 | 142,651,214 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.74,013,300 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.142,651,214 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.96,481,335 ක් සමඟ රු.239,132,549 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.50,300,010 ක් පමණක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.188,832,540 ක් විය. අයවීමේ ප්‍රගතිය සියයට 21 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | සමස්ත හිඟයෙන් සියයට 97 ක් ම නියෝජනය කරනුයේ මුද්දර ගාස්තු උසාවි දඩ හා වීඊී පහන් ප්‍රතිපූර්ණ වටිනාකමයි. එම වටිනාකම් රජයේ අරමුදල් වලින් ප්‍රතිපූර්ණය වීමට ඇති හිඟ මුදල් වන අතර බාහිර පුද්ගලයන්ගෙන් අය වීමට ඇත්තේ සමස්ත හිඟයෙන් 3% ක තරම් වූ සුළු ප්‍රමාණයකි. |

**2.2.3 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| **(අ)** | **වරිපනම්** | | |
| | ආරම්භක හිඟය රු.1,192,409 ක් වූ අතර, රු.306,660 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.1,499,069 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.142,509 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.1,356,560 ක් හිඟව පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 10 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී ජංගම සේවා පැවැත්වීම තුළින් මෙම හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** | **අක්කර බදු** | | |
| | ආරම්භක හිඟය රු.110,254 ක් වූ අතර, රු.11,197 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.121,451 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.1,290 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.120,161 ක් හිඟව පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට එකක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී සමීක්ෂණයක් සිදු කර ලේඛන ගත ඉඩම් හදුනා ගෙන බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) බදු කුලී** | | |
| ආරම්භක හිඟය රු.761,552 ක් වූ අතර, රු.3,245,491 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.4,007,043 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.2,654,143 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.1,352,900 ක් හිඟව පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුවේ | ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) බලපත්‍ර ගාස්තු** | | |
| ආරම්භක හිඟය රු.1,500,000 ක් වූ අතර, රු.11,112,302 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.12,612,302 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.10,723,702 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.1,888,600 ක් හිඟව පැවතුණි. | හිඟ බලපත්‍ර ගාස්තු කඩිනමින් අය කර ගත යුතුවේ | හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කර ඇත. |

### 2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.14,284,993 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.167,958,954 ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුවේ. | මුදල් අය කර ගැනීම සඳහා අදාළ ආයතන වලට ලිපි යවා ඇත. |

### 2.2.6 අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයේදී රු.7,750,286 ක වටිනාකමකට වූ අධිභාර 10 ක් පනවා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අධිභාර වල වර්තමාන තත්ත්වය පිළිබඳව සහතික කරන ලද පිටපත් මේ සමඟ යොමු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් සියල්ල වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේ දී සකස් කිරීමට පියවර ගනිමි. |

### 3.1.2 කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | නිදන්ගල ආදාහනාගාරය ඉදිකිරීම ප්‍රමාදවීම. | ව්‍යාපෘති නියමිත කාලවකවානුව තුළ නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘතිය අතරමඟ නැවතී ඇති අතර ආදාහනාගාරය ඉදි කිරීමට ලද ඉතිරි මුදල ප්‍රාදේශිය සභාවේ ගිණුමට ලබා දෙන මෙන් 2010 ජනවාරි 21 දින වැලි/ප්‍රාස/ආදහ/11/2006 යන ලිපියෙන් ඉල්ලීමක් කර ඇතත් එම මුදල ලැබුණු බවට ලේඛන වලින් තහවුරු කර ගත නොහැක. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වරකාපිටිය ආදාහනාගාර ඉදිකිරීම ප්‍රමාදවීම. | ව්‍යාපෘති නියමිත කාලවකවානුව තුළ නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2017/2018 වර්ෂයේ නැවතත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු.45,000,000 ක මුදලක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් අනුමත කර පුර නැගුම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක වේ. |
| (ඇ) | දෙනිපිටියේ ඉදිකිරීමට යෝජිත විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ප්‍රමාදවීම. | ව්‍යාපෘති නියමිත කාලවකවානුව තුළ නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 අයවැය යෝජනා යටතේ සකස් කිරීමට යෝජනා කර ඇත. |

### 3.1.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කසළ බැහැර කිරීම සඳහා හුවමාරු කරගෙන තිබූ අක්කර 01 රූඩ් 01 පර්චස් 2.8 ක් වූ ගරාඩුව කඩොලාන නමැති ඉඩමේ මහජන විරෝධය නිසා කසළ බැහැර කිරීම 2015 වසරේ සිට නවතා තිබුණි. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කළ යුතුවේ. | පහත් බිම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට නිර්දේශ ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර එම නිර්දේශ ලැබුණු පසු එහි කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත අතර මේ වසර තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. |
| (ආ) | පොල්අතුමෝදර ගඟ රක්ෂිතයේ ඉඩම් 03 ක නීත්‍යානුකූල නොවන ලෙස කසළ බැහැර කර පස්වලින් වැසීම සිදුකර තිබුණි. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කළ යුතුවේ. | කඹුරුගමුව ගරාඩුව ඉඩම සඳහා මහජන විරෝධය නිසා පෞද්ගලික ඉඩම් තුළ හා පොල්වතු මෝදර ගඟ රක්ෂිතයේ කසළ බැහැර කිරීම සිදු කළ අතර පරිසරයට වන හානිය අවම කිරීම සඳහා පස් දමා වසා දැමීමට සභාව මඟින් කටයුතු කර ඇත. |
| (ඇ) | පෞද්ගලික ඉඩම්වලට බැහැර කළ කසළ ආවරණය කිරීම සඳහා පස් දැමීම වෙනුවෙන් 2015 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සභාවේ යන්ත්‍ර භාවිතා කිරීම වෙනුවෙන් රු.1,709,935 ක වියදම් දරා තිබුණි. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කළ යුතුවේ. | පරිසරයට වන හානිය අවම කිරිම සඳහා පස් දමා වසා දැමීමට සභාව මඟින් කටයුතු කර ඇත. ඒ සඳහා පස් ප්‍රවාහනයට සභාවේ රථ වාහන හා පස් කැපීමට බැකෝ යන්ත්‍ර යොදා ගෙන ඇත. ඒ සඳහා රු.1,709,935 ක මුදලක් දරා ඇත. |

### 3.1.4 තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන සැලැස්ම මේ වන විට සකස් කර අවසන්කර ඇත. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 11 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 27 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 පරිදි අනුමත නොවූ සේවකයින් සඳහා පළාත් පාලන කොමසාරිස් හරහා විධිමත් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |
| (ආ) | **සේවක ණය** | | |
| | සභාවේ සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම් පැහැර හැර ඇති සේවකයින්ගෙන් අයවිය යුතු රු.105,930 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | හිඟ ණය මුදල් අයකර ගත යුතුවේ. | මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 ක් අබලන් තත්ත්වයේ පැවතුණු අතර ඉකුත් වර්ෂයේ සිදුකළ තක්සේරුව අනුව මාසික තක්සේරු මුදල රු.1,700 ත් රු.3,400 ත් අතර විය. එහෙත් කඩ කාමර අළුත්වැඩියා නොකිරීම නිසා මෙම නව තක්සේරු කුලිය අය කිරීමට නොහැකිව තිබුණි. | වත්කම් නඩත්තු කර ආදායම් ඉපයීමට යොදාගත යුතුවේ. | 2019 අය වැය යෝජනා යටතේ මිරිස්ස ප්‍රදේශයේ වෙළඳ සංකිර්ණයක් ඉදි කිරීමට යෝජනා කර ඇත. |

### 3.3.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙනිපිටිය, වැලිපිටිය සහ ජයවික්‍රමපුර වෙළඳ සංකීර්ණයන්හි පිහිටි කඩ කාමර 14 ක් ප්‍රධාන මාර්ගයෙන් ඈත්ව පිහිටා තිබීම නිසා පාරිභෝගිකයින් ඒවාට යොමුවීම අඩු මට්ටමක පැවතුණි. සභාව විසින් මෙම කඩ කාමර කුලියට ලබා දීමට විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි කාලයේදී මුදල් ප්‍රතිපාදන වෙන් කර කඩ කාමර 06 ක් අලුත්වැඩියා කිරීමට බලාපොරොත්තු වේ. |

### 3.3.3 නිෂ්ක්‍රිය /ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ගොඩනැඟිලි 03 ක් ඵලදායී කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි. | සභාවට අයත් දේපල ඵලදායි කාර්යයන් සඳහා යොදාගත යුතුවේ. | දෙනිපිටිය ඉදිකිරීමට යෝජිත විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් වන ආකාරයට ඉදි කිරීම සඳහා 2019 වර්ෂයේ අයවැය ලේඛනයට යෝජනා කර ඇත. තුර්කි ගම්මාණයේ ප්‍රජා ශාලා |

ගොඩනැගිල්ල, සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැඟිල්ල හා ජයවික්‍රම පුර වෙළඳ පොළ ගොඩනැඟිලි අලුත්වැඩියාවක් සිදු කර ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා කෙරේ.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 05 ක ඉතිරිවීම් වල එකතුව රු.18,764,069 ක් වූ අතර එම අගයන් සියයට 05 සිට සියයට 65 දක්වා පරාසයක පැවතුණි. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | සමස්තයක් ලෙස ඇස්තමේන්තුගත මුළු අදායමෙන් 10% ක හිතකර විචලනයක් හා ඇස්තමේන්තුගත වියදමෙන් 15% ක හිතකර විචලනයක් දක්නට ලැබේ. ඒ අනුව අයවැය ලේඛනයෙහි ඵලදායීතාවයක් පවතී. |
| (ආ) | අදායම් විෂයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.10,260,640 ක් වූ අතර එම අගයන් සියයට 09 සිට 16 දක්වා පරාසයක පැවතුණි. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | සමස්තයක් ලෙස ඇස්තමේන්තුගත මුළු අදායමෙන් 10% ක හිතකර විචලනයක් හා ඇස්තමේන්තුගත වියදමෙන් 15% ක හිතකර විචලනයක් දක්නට ලැබේ. ඒ අනුව අයවැය ලේඛනයෙහි ඵලදායීතාවයක් පවතී. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරිමට යෝජිත අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන අධිකාරි වෙත 2019 ජනවාරි 11 දින යොමු කර ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | 2019 අභ්‍යන්තර විගණන සැලැස්මේ කාල රාමුවට අනුව අභ්‍යන්තර විගණන කටයුතු මේ වන විට සිදු කරනු ලැබේ. |